# සත් බුදුරජාණන් වහන්සේලා උදෙසා කරන විශේෂ සම්බුද්ධ පූජාව

1. බුද්ධං සරණං ගච්ජාමි
ධම්මං සරණං ගච්ජාමි
සංඝං සරණං ගච්ජාමි
තිසරණ සරණං ගච්ජාමි

2. මුලින්ම අපි තිසරණයට සිත යොමු කරමු
පෙළින් පෙළට හිඳ කය කට සංවර කරමු
මලින් ගඳින් අපගේ සම්බුදු හිමි පුදමු
කලින්ම දැන් අපි පන්සිල් පද සිහි කරමු

3. කිසිදින නැහැ මම සතුන් මරන්නේ
මරන්න නැහැ කිසිදින පොළඹන්නේ
මැරුව සතුන් ගැන නැහැ තුටු වෙන්නේ
පරපණ නැසුමෙන් මම වළකින්නේ

4. නොදුන් දෙයක් නැහැ කිසි දින ගන්නේ
ගන්න නොදුන් දෙය නැහැ පොළඹන්නේ
ගත්ත නොදුන් දෙහි නැහැ තුටු වෙන්නේ
සොරකම් කෙරුමෙන් මම වළකින්නේ

5. නැහැ මම කම්සැප පසුපස යන්නේ
කම් සැප වින්දට නැහැ ඇති වෙන්නේ
කම් සැපමයි දුක් ගොඩක් ගෙනෙන්නේ
නැහැ කාමෙහි වැරදිව හැසිරෙන්නේ

6. බොරුවෙන් බොරුවට බොරුම කියන්නේ
බොරු කිය කිය ලෝකය රවටන්නේ
බොරු කියනා කට ගදම ගහන්නේ
බොරුවෙන් මම වැළකී තුටු වෙන්නේ

7. සුරාව කිය කිය ලෝදිය බොන්නේ
සුරාවෙ කොතැනද හොඳක් තියෙන්නේ
සුරා සොඬුන්මයි බේබදු වෙන්නේ
සුරාව නැහැ මම කිසිදින ගන්නේ

8. බුදුගුණ සිහි කොට දම්ගුණ සිහිකොට
සගගුණ සිහි කොට මේ ලෙස හැමවිට
නිති පන්සිල් අටසිල් ගෙන පොහොයට
දවසින් දවසට ළංවෙමි නිවනට

9.නමස්කාර වේවා බුදුරුවනට හැමදා බුදුහිමි සරණයමි
නමස්කාර වේවා දම් රුවනට හැමදා සදහම් සරණයමි
නමස්කාර වේවා සග රුවනට හැමදා මහසග සරණයමි
නමස්කාර වේවා තුනුරුවනට හැමදා තෙරුවන් සරණයමි

10. බුද්ධං බුද්ධං බුද්ධං වන්දේ
ධම්මං ධම්මං ධම්මං වන්දේ
සංඝං සංඝං සංඝං වන්දේ
බුද්ධං ධම්මං සංඝං වන්දේ

11. බුදුගුණ දම්ගුණ සඟගුණ නමදිමු
බුදුබණ අදහණ හැමදෙන එක්වෙමු
අද්දින බුදුගුණ ගැන ගැන සැනසෙමු
හැමදෙන වැඳගෙන බුදුගුණ පවසමු

12. මොහඳුර දුරුකොට බුදුරැස් විදු
තිලොවම අමමෙත් ජලයෙන් සේදූ
බුදුහිමියනි නිවනට මග පෑදූ
පුදුදෙමි මෙපහන් බැතියෙන් සාදූ

13. නිබඳ අමා දම් රස සිහි කරමි
නැමඳ සමිඳ ඔබෙ සිරිපද සිඹිමි
මහඳ සිසිල් බුදු කුටියක් කරමි
සුවඳ දුමින් මගෙ බුදුහිමි පුදමි

14. කුසල් දහම් ගැන හොඳ හැටි දැනගමි
අසල් වැසියනුත් ගෙන බුදු මගඑමි
සුසිල් බවින් මම හදවත සනසමි
සිසිල් පැනින් මගෙ බුදුහිමි පුදදෙමි

15. අලංකාර මල් ගෙන ලස්සනට සරසලා
බලන්න ලස්සනද පහන් දිලෙන නැලවිලා
සුළං රැලින් සුගන්ධ දුම් ගෙනෙයි ගල ගලා
ගිලන් පසින් බුදුන් පුදමු පවන් සල සලා

16.මතු බුදුවෙන මෙත් මාහිමි ගැනද සිහිවෙලා
සිතු සිතු සම්පත් ගෙන දෙන පින්වැළක් කලා
නෙතු නෙතු අග දැන් සතුටින් මදක් තෙත් වෙලා
චතු මධුරෙන් පුජාවම අසිරිමත් කලා

17.චතු මධුරෙන් පුජාවම අසිරිමත් කලා
සිතු සිතු සම්පත් ගෙන දෙන පින්කමක් කලා
නෙතු නෙතු අග දැන් සතුටින් මදක් තෙත් වෙලා
මතු මිතු දම් සුරැකේවා මල් දමක් වෙලා

18. ලොවුතුරු ගුණ අපමණ බව දනිමි
විසිතුරු ලෝකෙන් මම සමු ගනිමි
නිරතුරු මම බුදුගුණ සිහි කරමි
පළතුරු යුෂයෙන් බුදුහිමි පුදමි

19. කිරිපිඩු ආහර ලෙස ගෙන මුනිදා ( මෙම කවිය දානය පුජාකරනවිට පමණයි )
වෙර වැඩු සම්බුදු පදවිය ලැබුදා
සිහි කර එම ගුණ සිරිපද නැමදා
පුදුදෙමි ආහර වැඳ වැඳ සැමදා

20. රහත් බවින් අගතැන්පත් වන්නේ
පහත් වැඩක් කිසිදින නොකරන්නේ
බෙහෙත් වලින් මම මුනිදු පුදන්නේ
දොහොත් මුදුන් බැද සාදු කියන්නේ

21. මගෙ බුදුහිමියන් මට දෙසු විලසා
මම බුදුමග එම් හැම් දින මෙලෙසා
පුදමින් මෙම මල් බුදුගුණ පවසා
වඳිනෙමි දෙපතුලෙ තබමින් සිරසා

22. දල්වලා පහනුත් සුගන්ධය පතුරලා මල් අතුරලා
සිල්බලා සංවරවෙලා අපි ගිලන් පස පුජා කලා
මංමුලා වු සසර කතරින් එතෙර වෙන්නට පින්කලා
වනසලා කෙලෙසුන් නිවන් සැප ලබමු අපි අරහත් වෙලා

23. සම්මා සම්බුදු ගුණ සිහිවේවා
නිම්මා නැති සසරින් ගොඩඒවා
පෙම්මාදර සිත සුවපත් වේවා
අම්මා මතු නිවණින් සැනසේවා

24. සොයා අහර දී දිව රෑ බෝවා
දයා දියෙන් නිබඳව මම නාවා
කියා දෙමින් ගුණ සෙනෙහස පෑවා
පියා මගේ නිවණින් සැනසේවා

25. මව්ගුණ පියගුණ නිති සිහිකරමි
මම මගෙ ගුරුවරු නිරතුරු පුදමි
වැඩිහිටි හැමදෙන හට ගරු කරමි
මම බුදුහිමි දෙසු ලෙස දිවිගෙවමි

26. අපි බුදු හිමි දෙසූ ලෙස දිවි ගෙවමු
සදහම් ගඟුලෙහි පැන පැන නහමු
දම්රසයෙන් පිරි ලොවක් ම තනමු
දැන් අපි සත් බුදුගුණ සිහි කරමු

27. කල්ප අනු එකක් පුරා සුවඳයි කළසේවා
අල්ප දෙයක් පිදුවත් එය මහා පිනක් වුවා
බන්දුමතී අග නගරේ මැණික් පහණ කීවා
විපස්සි සම්බුදු හිමිහට මෙම පූජා වේවා

28. මැකී නොයන ලෙස සිත් තුළ මුනි ගුණ ලියවේවා
මෙකී මුනිඳු එක් තිස් කපකට පෙර බුදුවුවා
දැකී මත් පිනක් සැමසත් නිදුකින් සැරදේවා
සිඛී මුනිඳු හට පිරිසිදු මෙම පූජාවේවා

29. සාල ගසක් යට වැඩසිට ලොව සම්බුදු වුවා
සෝනුත්තර අගසව්වන් මුනි දෙපසෙහි වුවා
එක් තිස් කපකට පෙර සිට මුලුලොව බැබලුවා
වෙස්සභූ සම්බුදුහිමි හට මෙම පූජා වේවා

30. මහරි මල්ගසක් යට වැඩ සිට සම්බුදු වුවා
මහා භද්‍ර කල්පයෙ මෙම පළමු බුදුන් වුවා
මහා තේජවන්ත ලෙසින් සදහම් පැවසුවා
කකුසඳ සම්බුදු හිමිහට මෙම පූජා වේවා

31. දිඹුල් රුකක් යට වැඩහිඳ තිලොවට ගුරු වුවා
තිස් දහසක් ආයුෂ සිරි විඳ විඳ කලෙ සේවා
මාන දමන කර නිදුකින් ලොව සත සැනසුවා
කෝනගමන මුනිඳුන් හට මෙම පූජා වේවා

32. නුගරුක් බෝධිය කරගෙන ලොව සම්බුදු වුවා
සර්ව මිත්‍ර මහතෙරිඳුන් නිති හිමිලග වුවා
වස් විසිදහසක් වැඩහිඳ සත්වග සැනසුවා
කස්සප සම්බුදු හිමිහට මෙම පූජා වේවා

33. ලෝක සතුන් වෙත පැව උතුම් මෙත පැතුරුණමෙත් සයුරක් වුවා
මේක මහා පුදුමේකි ලොවේ අපි ගෞතම හිමි ලගටම ආවා
නේක ලෙසින් අපි සාධු සිතින් සැදූ සැම පුදම පූජා වේවා
සෝක තැවුල් නැති ඛේද කිසිත් නැති නිවනම අපහට හිමිවේවා!

34. සෝක තැවුල් නැති ඛේද කිසිත් නැති නිවනම අපහට හිමිවේවා
මේක මහා පුදුමේකි අපේ පින මේ භවයෙත් අපි හමුවුවා
රෑක දවාලක සීතක අව්වක වැස්සක පින්නක හෝ වේවා
නේක දහම් වැටහී සැනසී සිත සැමටම නිවනම හිමිවේවා!

සාධු! සාධු! සාධු!

(පබැඳුම- තල්ගස්වැවේ සීලානන්ද ස්වාමීන් වහන්සේ ආරණ්‍ය සේනාසනය වෙස්ට් වර්ජිනියා )

විමසීම- seela22bhavana@gmail.com